උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය -2020
-----------------------------------------------------

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ අංක 2639/2640 (එස්එෆ්) එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සහ 2012 නොවැම්බර් 19 දිනැති අංක 2890 (එස්ආර්අයි) (එස්එෆ්) සහ අංක 2891( එස්ආර්අයි) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.04 සහ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය
-----------------------------------------------------------------

ණය ගිවිසුම්වලට අනුව, එවකට වරාය සහ මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික මට්ටමින් ව්‍යපෘතියේ කටයුතු කළමනාකරණය සහ සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිනු ලැබේ. උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ගයවල කිලෝමීටර් 170ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,790 කට සමාන එජඩො මිලියන 146 ක් වූ අතර ඉන් රු.මිලියන 14,950 කට සමාන එජඩො මිලියන 130ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද, 2012 නොවැම්බර් 12 දිනැති 2890 එස්ආර්අයි (එස්එෆ්) දරන අතිරේක ණය ගිවිසුම යටතේ රු.මිලියන 8,840කට සමාන එජඩො මිලියන 68ක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර ඉන් රු.මිලියන 4,420කට සමාන එජඩො මිලියන 34 ක් උතුරු සහ උතුරු මැද පළාත්වල පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත වෙන්කර තිබුණි. ඊට අමතරව 2012 නොවැම්බර් 12 දිනැති 2891 එස්ආර්අයි දරන ණය ගිවිසුම යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ගය සඳහා රු.මිලියන 3,900කට සමාන එජඩො මිලියන 30ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු මුල් ණය ගිවිසුම යටතේ 2010 ඔක්තෝබර් 22 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිමකර තිබුණි. අතිරේක මූල්‍ය පහසුකම් යටතේ ව්‍යාපෘතියේ කටයුතු 2013 මැයි 13 දින ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර එය 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

1.3 මතය
------

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම
------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි.තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දූස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන **535.68**ක් වටිනා වත්කම් මාරු කර තිබුණද, මූල්‍ය ප්‍රකාශන සමඟ අදාළ වත්කම්වල උපලේඛනය ඉදිරිපත් කර නොතිබුණි. තවද, වත්කම්වල වටිනාකම සමඟ වත්කම්වල විස්තර සම්බන්ධ විගණන සාක්ෂි සහ ඉහත වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය භාරගැනීම පිළිබඳ තොරතුරු විගණනය සඳහා ලැබී නොතිබුණි. | **2020** වර්ෂය තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී ඇති රු.**67,007,655.63** වටිනා ගොඩනැගිලි සහ රු. **93,800,000.00** වටිනා වාහන සඳහා භාරදීමේ ලියවිලි සහ උපලේඛන සහ රු. **372,000,288.83** වටිනා වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අවස්ථා කිහිපයකදී කොටස් වශයෙන් පසුගිය මුදල් වර්ෂයට අදාළ භාරදී ඇත. | ව්‍යාපෘති කාර්යාලය මගින් උපකාරක ලියවිලි සහ වෙනත් වාර්තා වෙනමම පවත්වා ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | විදුලිය, දුරකථන, ජලය, කාර්යාල කුලිය සහ පිරිසිදු කිරීමේ ගාස්තු වැනි රු.මිලියන **3.71**ක පොදු කාර්ය පිරිවැය සහ එකතුව රු.මිලියන **28.65**ක ව්‍යාපෘති වැඩිවන වියදම් එකම ගොඩනැගිල්ල තුළ ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති **03** අතර බෙදා හැරීමකින් තොරව මෙම ව්‍යාපෘතියේ පිරිවැය ලෙස අයකර තිබුණි. | උතුරු මාර්ග සම්බන්ධ කරන ව්‍යාපෘතිය සඳහා ස්ථාපනය කරන ලද එකම කාර්යාලය තුළ ව්‍යාපෘති **03** ක් ක්‍රියාත්මක විය. උතුරු මාර්ග සම්බන්ධකරණ ව්‍යාපෘතිය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් අයිතිව තිබුණි. පොදු පිරිවැය ව්‍යාපෘති අතරේ බෙදා හැරීම නිවැරදි ක්‍රමය වුවද, එම ක්‍රමය අනුගමනය කිරීමේදී අපහසුතාවන්ට අප මුහුණ දෙනු ලබයි. | එම ව්‍යාපෘතිවල නිවැරදි පිරිවැය දැක්වීමට ව්‍යාපෘතියේ පොදු කාර්ය පිරිවැය ව්‍යාපෘති අතර බෙදාවෙන් කළ යුතුය. |
| (ඇ) | **2020** දෙසැම්බර් **31** දිනට ආසියානු සංවර්ධන බැංකු ණය අංක **2890** (එස්ආර්අයි) (එස්එෆ්) දැක්වෙන රු.මිලියන **4,833.53**ක ලෙජර් ශේෂය රු. මිලියන **4,831.56** ලෙස මූල්‍ය ප්‍රකාශනවල වැරදි ලෙස ගිණුම්ගත කර ඇත. එම නිසා, මූල්‍ය ප්‍රකාශනවල ණය ශේෂය රු. මිලියන **1.97**කින් අඩුවෙන් දක්වා තිබුණි. | **2020** මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද **2020.12.31** දින අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශය සකස් කිරීමේදී **2020.01.01** දිනට වැරදි ආරම්භක ශේෂයන් ගැනීම හේතුවෙන් රු. **1,961,961** හා රු.**8,506,421**ක වෙනස්කම් පැන නැගී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි ණය ශේෂය ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ආසියානු සංවර්ධන බැංකු ණය අංක **2891** (ඒආර්අයි) දැක්වෙන රු.මිලියන **4,134.06**ක ලෙජර් ශේෂය රු. මිලියන **4,142.60**ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වැරදි ලෙස ගිණුම්ගත කර ඇත. එම නිසා, මූල්‍ය ප්‍රකාශනවල ණය ශේෂය රු. මිලියන **8.54**කින් වැඩියෙන් දක්වා තිබුණි. | **2020** මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද **2020.12.31** දින අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශය සකස් කිරීමේදී **2020.01.01** දිනට වැරදි ආරම්භක ශේෂයන් ගැනීම හේතුවෙන් රු. **1,961,961** හා රු.**8,506,421**ක වෙනස්කම් පැන නැගී තිබුණි. | මූල්‍ය ප්ර්කාශනවලට නිවැරදි ණය ශේෂය ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලද ජංගම නොවන වත්කම්වල සමුච්චිත ක්ෂය ලෙස ජර්නල් මාරු කිරීම් අංක 20 - 93 මගින් එකතුව රු. මිලියන 67.05ක් වාර්තා කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 43.56ක් ලෙස එය අනාවරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 23.48කින් ජංගම නොවන වත්කම්වල අගය වැඩියෙන් දක්වා තිබුණි. | විගණනය කරුණු දැක්වීම නිවැරදි වේ. 2021 සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදි. | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි ජංගම නොවන වත්කම්වල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**2.2 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතියේ ගනුදෙනු මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් වී නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය මාර්ග සංවර්ධන අධිකාරිය වුවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මහාමාර්ග අමාත්‍යාංශය වේ. මහා මාර්ග අමාත්‍යාංශයේ විගණන අංශය නිතර පැමිණෙන අතර මෙම ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනය කරනු ලැබේ. | ව්‍යාපෘතියේ ගනුදෙනු මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතුය. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්රලේඛ උපදෙස් සමග අනුකූලවීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික ප්‍රගතිය**

ලැබී තිබුණු තොරතුරු අනුව, පුනරුත්ථාපනය කළ ජාතික මාර්ග 3ක වර්ෂ 3ක කාර්යසාධනය මත නඩත්තු කටයුතු ඇතුළුව උතුරු සහ උතුරු මැද පළාත්වල කොන්ත්‍රාත් පැකේජ 10ක් යටතේ පිරිනමන ලද ජාතික මාර්ග 6ක කොටස් කිලෝමීටර 170ක පුනරුත්ථාපන කටයුතු 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. තවද, ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ මාර්ග පුනරුත්ථාපනය මත ඉතුරුම් භාවිතයෙන් අනෙකුත් ජාතික මාර්ග 2හි පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව 2015 පිරිනමා තිබුණු අතර 2016 වර්ෂයේදී නිම කර තිබුණි. ඊට අමතරව 2016 දෙසැම්බර් 31 දිනට අතිරේක මූල්‍ය පහසුකම් යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 7ක කිලෝමීටර 122ක වෙනත් කොටස් පුනරුත්ථාපන කටයුතු අවසන් කර තිබුණි. ණය මුදලෙහි ඉතුරුම් වලින් මහනුවර යාපනය

මාර්ගයේ (ඒ 009) රබෑව සිට මැදවච්චිය දක්වා කොටසේ කිලෝමීටර 9.64 ක් පුනරුත්ථාපනය සඳහා 2017 අප්‍රේල් 28 දින නව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර 2018 ඔක්තෝබර් 31 දිනට නිමකර තිබුණි. තවද, ව්‍යාපෘතිය මැදවච්චිය හොරොව්පතාන මාර්ගයේ කොටසක් (බී 238) පුනරුත්ථාපනය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත් 2ක් පිරිනමා තිබුණි. කෙසේවෙතත්, පුනරුත්ථාපනය කටයුතු 2020 වර්ෂයේදී නිමකර තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මැදවච්චිය-හොරොවපතාන මාර්ගයේ කොටස් දෙකක නැවත ඉදිකිරීමේ හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු වෙත රු.මිලියන 1,388 පිරිවැයකට පිරිනමා තිබුණි. කෙසේවෙතත්, එය 2020 වර්ෂයේදී නිමකර තිබුණි. | 2019 මාර්තු 30 කටයුතු ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් අවසාන වන විට නිම කිරීමට අපේක්ෂිතය. අවාසනාවකට රටේ පැවති නොසන්සුන්තාව තත්ත්වය හේතුවෙන් 2019 අප්‍රේල් මාසය තුළ ඇඳිරි නීතිය පනවන ලදි. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පවා පුපුරන ද්‍රව්‍ය නිකුත් කිරීම රජය නවත්වන ලදි.<br><br>මෙම තත්ත්වය ඉදිකිරීම් කටයුතු සඳහා අවාසිදායක ලෙස බලපාන ලදි. තවද, ඉදිකිරීම් කටයුතු දක්වා 2020 මාර්තු සිට මැයි දක්වා කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපාන ලද අතර කොන්ත්‍රාත්කරුවන්ට වැඩබිම තාවකාලිකව වසා දැමීමට සිදු විය. පිළිගත හැකි හේතු නිසා ප්‍රමාද සිදු වී ඇති අතර කොන්ත්‍රාත්තු 2020 අගෝස්තු නිම කිරීමට අපේක්ෂිතය. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර ඉතිරි ව්‍යාපෘති කාලපරිච්ඡේදය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. |
| (ආ) | මැදවච්චිය සිට මන්නාරම දක්වා මාර්ගයේ පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ කටයුතු අපේක්ෂිත පරිදි නිමකර තිබුණු අතර අනෙකුත් මාර්ග 13 දින 63 සිට දින 214ක දක්වා ප්‍රමාද පරාසයක් සහිතව නිම කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ඉහත කොන්ත්‍රාත්කරුවන්ගෙන් කිසිදු ප්‍රමාද ගාස්තුවක් අයකර නොතිබුණි. | මැදවච්චිය මන්නාරම මාර්ගයේ සීපි 16 කොන්ත්‍රාත් පැකේජය පමණක් ආරම්භක කොන්ත්‍රාත් කාලය තුළ නිම කර තිබුණු බව අප පිළිගනු ලැබේ. ප්‍රමාණ ඉහළයාම, පස් සැපයීම සඳහා වළවල් කැපීමේ කටයුතු සීමාකිරීම, මහජනතාවගේ ඉල්ලීම පරිදි අමතර කටයුතු කිරීම වැනි පිළිගත හැකි සහ සාධාරණීකරණය කළ හැකි හේතූන් නිසා අනෙකුත් සියලුම කොන්ත්‍රාත් පැකේජවලට නිම කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම් ලබාදී ඇත. අනුමත කාල දීර්ඝ කිරීම් මගින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇති විට කොන්ත්‍රාත් කාලය අවසන් වන තෙක් ප්‍රමාද ගාස්තු අඩු කර ගැනීමට හේතුවක් නොමැත. එමනිසා, කිසිදු කොන්ත්‍රාත්තුවකින් ප්‍රමාද ගාස්තු අඩුකර ගෙන නොමැත. | කොන්ත්‍රාත් ගිවිසුමේ ලබාදී ඇති වගන්ති සමග අනුකූලවීම අවශ්‍ය වේ. |

(ඇ) පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් මහනුවර යාපනය මාර්ගය (ඒ009) රබෑව සිට මැදවච්චිය දක්වා මාර්ග කොටස සඳහා පිළියෙල කරන ලද පිරිවැය ඇස්තමේන්තුව කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද පිරිවැයට වඩා සියයට **3.01**ක් නියෝජනය කරන රු.මිලියන **24.12**කින් වැඩි වී තිබුණි. තවද, ප්‍රමාණ පත්‍රයේ සඳහන් අයිතම **32** ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා සියයට **59.66** සිට සියයට **1845** දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණු අතර කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද පිරිවැයට වඩා එකතුව රු. මිලියන **136.63**ක් ගෙවා තිබුණි.

බිමෙහි තත්ත්වය පිළිබඳ විස්තරාත්මක විමර්ශනයකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ. සිවිල් කටයුතුවලදී භූමියෙහි යටින් පවතින හැසිරීම සහ අපේක්ෂිත කටයුතු නිශ්චිතවම අනුමාන කළ නොහැකි අතර එමනිසා ඇස්තමේන්තු සංකල්පීය උපකල්පන කිහිපයක් මත පිළියෙල කරනු ලැබේ.

කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරු පෙළඹවීම සහ ඉදිකිරීම් කටයුතු සමීපව අධීක්ෂණය කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ.